**ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- මණ්ඩලය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු සඳහා මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මගින් මුළුමනින්ම අරමුදල් සපයන ලද අතර එම නිසා මණ්ඩලයේ කාර්යයන්ගෙන් අතිරික්තයක් / හිඟයක් උත්පාදනය නොවිය. රු.3,768,748 කින් වියදම් වැඩිවී ඇති බව පෙන්නුම් කරමින්, සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සහ ඊට පෙර වර්ෂයේ අනුපිළිවෙලින් රු. 71,236,691 ක් සහ රු. 67,467,943 ක් රජයේ ප්‍රදාන වශයෙන් මණ්ඩලයට ලැබී තිබුණි. කාර්ය මණ්ඩල පිරිවැය සහ ගොඩනැඟිලි කුලිය වැඩිවීම මෙම තත්ත්වය ඇතිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදවීම්

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා රු.5,086,000 ක මුදලක් වැය කරමින් කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. සවිස්තරාත්මක මෘදුකාංග තාක්ෂණික ලේඛනගත කිරීම (DSTD), පරීක්ෂණ සැලැස්ම සකස් කිරීම, පරිශීලක පිළිගැනීමේ | ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ (SLAASMB) මෙහෙයුම් ක්‍රියාවලියේ සුවිශේෂත්වය සැලකිල්ලට ගනිමින්, (තොරතුරු තාක්ෂණ සංවර්ධකයින්ට හුරුපුරුදු සාමාන්‍ය ව්‍යාපාරික මෙහෙයුමක් මෙන් නොව), සවිස්තරාත්මක මෘදුකාංග අවශ්‍යතා පිරිවිතර (DSRS) සකස් කිරීම සහ ඉදිරිපත් කිරීමේ අදියර සම්පූර්ණ කිරීමට | සමාලෝචන කාර්යයන් ආවරණය කිරීම සඳහා කළමනාකරණ තොරුතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු කඩිනමින් සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| පරීක්ෂණය (UAT) නිර්ණායක ලේඛනය පිළියෙල කිරීම සහ අයදුම්පත් මූලාකෘතිය නිල වශයෙන් අනුමත කිරීම යනාදිය පමණක් සම්පූර්ණ කර ඇත. කෙසේ වුවද, පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ මන්දගාමී ප්‍රගතිය හේතුවෙන්, 2022 අගෝස්තු අවසානයේදී හෝ පද්ධතියේ අපේක්ෂිත අරමුණු වන ක්‍රියාකාරීත්වය සමාලෝචනය කිරීමේ අරමුණ සඳහා එය භාවිත කළ නොහැකි වේ. | අපේක්ෂිත කාලයට වඩා දිගු කාලයක් ගත විය. INOVA විසින් සකස් කරන ලද සවිස්තරාත්මක මෘදුකාංග අවශ්‍යතා පිරිවිතර (DSRS) සහ පද්ධති මූලාකෘති ද සවිස්තරාත්මක දීර්ඝ වාර්තා වන අතර, මේ සම්බන්ධයෙන් කටයුතු කරන සියලු පාර්ශවයන් විසින් ප්‍රවේශමෙන් සමාලෝචනය කර සාකච්ඡා කළ යුතු අතර, පසුව සුදුසු සහ පිළිගත හැකි වාර්තා නිල වශයෙන් අනුමත කර අවසන් වන තෙක් සංශෝධනය කරන ලදී. | |

## 3.1 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ පුරප්පාඩු 16ක් පැවතුණි. සම්පූර්ණ පුරප්පාඩු අතරින් පුරප්පාඩු 12ක් මණ්ඩලයේ ප්‍රධාන කටයුතු සිදු කිරීම සඳහා ද බලපෑමක් සිදු කළ හැකි ආකාරයේ විධායක මට්ටමේ පුරප්පාඩු විය. එමෙන්ම, සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය (SoR) සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමතිය 2022 අගෝස්තු මාසය වන විටද ලැබී නොමැත. | 2020 ඔක්තෝම්බර් මාසයේදී නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (DDG) අධ්‍යක්ෂ ජනරාල් ලෙස අභ්‍යන්තර උසස්වීම් ලැබීමෙන් පසුව, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (DDG) තනතුර පුරප්පාඩු විය. සංශෝධිත වැටුප් යෝජනාව පිළියෙළ කර අවසන් වූ පසුව මෙම පුරප්පාඩුව පිරවීමට තීරණය විය. බඳවා ගැනීමේ පටිපාටියට (SoR) අනුකූලව, ඉහළ වර්ෂ සංඛ්‍යාවක පළපුරුද්ද අවශ්‍ය වීම හේතුවෙන්, DT තනතුරු සඳහා සුදුසු අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පිරවීමට මණ්ඩලයට නොහැකි විය. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (DDTs) තනතුර සහ සහකාර අධ්‍යක්ෂ ජනරාල් (ADTs) තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටි (SoRs) සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමතිය අපේක්ෂිතය. සහකාර අධ්‍යක්ෂ | කර්තව්‍යයන් සඳහා ඵලදායී ක්‍රියාමාර්ග ගනිමින් මණ්ඩලයේ පුරප්පාඩු පිරවිය යුතුය. |

ජනරාල් (ADTs) තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටිය (SoR) අනුමත කළ යුතුය. මේ දක්වා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් බඳවා ගැනීමේ පටිපාටිය (SoR) සඳහා අනුමතිය ලබා දී නොමැති අතර, තාක්ෂණික කාර්ය මණ්ඩලය සඳහා අමාත්‍ය මණ්ඩලය මගින් අනුමත කරන ලද වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය අනුමැතිය මණ්ඩලය අපේක්ෂා කරයි.